

# රට වට කළ මුහුදෙන් රට ගොඩ නගමු

**ශ්‍රී ලංකාව ලස්සන මෙන්ම වාසනාවන්ත රටකි. ලෝකයේ සමහර රටවලට මුහුද මායිම් නොවේ. මුහුදු වෙරළක් නොමැතිකම ගැන සමහර රටවල් පසු තැවෙයි. ඒ අතින් ලංකාව තරම් වාසනාවන්ත රටක් තවත් නැත. ලංකාව වටේටම මුහුද ය. එහෙත් මාතෘ භූමියේ වාසනාවට උරුමවුනු මෙම මුහුදින් වාසනාවේ මහිමය උකහා ගන්නට අප ගෙන ඇත්තේ කෙබඳු පියවර ද?**

මුහුදු සීමාවේ සිටින සමහර පිරිස් සිය ජීවිකාව සඳහා වෘත්තියක් ලෙස මාළු ඇල්ලීමේ යෙදෙති. එයින් පිටස්තරව මේ වාසනාවන්ත මුහුදින් වෙනත් කිසිදු ප්‍රයෝජනයක් ගන්නට අප සාර්ථක පියවරක් ගෙන නැත. ශ්‍රී ලංකාවේ ආර්ථිකය යහපත් කර ගැනීම සඳහා මුහුද තරම් ප්‍රයෝජනයට ගන්නට පුලුවන් වෙනත් සම්පතක් නැති තරම් ය.

"සාගර අධ්‍යයන විද්‍යාව" ලෙස අද විශේෂ විෂයයක් ලෝක අධ්‍යාපන ක්ෂේත්‍රයට එකතු වී තිබෙන්නේ මේ සුවිශේෂී බව නිසා ය.

අඩුම වශයෙන් මාළු ඇල්ලීමට අමතරව මත්ස්‍ය වැඩි කිරීම, උම්බලකඩ සෑදීම, මාළු ටින් කර පිටරට යැවීම, නැව් සහ වෙනත් මුහුදු වාහන සෑදීම, මසුන් ඇල්ලීම සඳහා අවශ්‍ය උපකරණ සෑදීම වැනි ලොව කවුරුත් දකින කාරණා සම්බන්ධයෙන් වුව ද ප්‍රබල ලෙස අධ්‍යනය කර රටට ඵල ප්‍රයෝජන ගැනීමේ වැඩ පිළිවෙළක් මෙතෙක් සැකසී නැත.

ලංකාව වටේට ම මුහුද තිබුණත් ලංකාවේ සමහර ප්‍රදේශවල ජනතාවට ලෙහෙසියෙන් මාළු කෑල්ලක් ගන්නටවත් පහසුකම් නොමැත. කලෙක ඒ අරමුණින් ඇති කළ ධීවර සංස්ථාව ද බලයට පත් ආණ්ඩු විසින් පෞද්ගලික මුදලාලිලාට උරුම කර දුන්නේ ය.

අපේ රටේ වාසනාවට උරුම වුණු මේ මුහුදු සම්පතින් උපරිම ප්‍රයෝජන ගැනීමට අත හිත යෙදිය යුතු ය. ලෝක භූමි ප්‍රදේශයෙන් 71% ක් ම සිසාරා පැතිරී තිබෙන්නේ මහා සාගරය හෙවත් මුහුද යි. ඒ අනුව පෘථිවියේ වියළි භූමි ප්‍රදේශය 29% කි.

සාගරය පිළිබඳ විද්‍යාව වර්ග හතරකට බෙදිය හැකි ය. භෞතික, රසායනික, භූ විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක යනුවෙනි. එහි අරමුණ, භෞතික වශයෙන් සයුරේ උෂ්ණත්වය, ප්‍රවාහ, දියවැල්, වඩ දිය, බාදිය හා රැළි, මුහුදු වාතය අතර තාපය, තෙතමනය, කාලගුණය, අව්ව, වැස්ස, සුළඟ ආදිය අපට අවශ්‍ය ආකාරයට පාලනය කිරීමට යොදා ගත හැකි හැකියාවට මුහුද කොතරම් බලපාන්නේ ද ආදිය සොයා ගැනීම ය.

රසායනික වශයෙන්, මුහුදු ජලයේ සැඟැවී ඇති රහස් සොයා ගැනීම ඇතුළත් වේ.

මුහුදු වතුරින් ලෝහ වර්ග වැනි දෑ සෑදිය හැකි ද? මුහුදු ශාක හා සත්ව- යන්ගෙන් ඒ සඳහා ඇති බලපෑම් මොනවාද ආදී වශයෙන් සොයා ගත හැකි බොහෝ දේ වෙයි.

භූ විද්‍යාත්මකව මුහුදු පතුලේ හැඩය, මූලාරම්භය, එහි ස්වරූපය, ලෝකයේ මූලාරම්භය මුහුදු පතුලේ පවතින දේවල්, මුහුදු පතුළ සෑදී ඇත්තේ කුමන දේවලින් ද, මුහුදු පතුලේ ඇති ඛනිජ සම්පත්, පැරණි ශාක හා සත්ත්ව කොටස් ඔස්සේ පරීක්ෂණ පැවැත්වීම් කළ හැකි ය.

ජීව විද්‍යාව යටතේ, මුහුදේ ඇති ශාක සහ සතුන් ඇතුළු වෙනත් මුහුදු වස්තූන් පිළිබඳ අධ්‍යයනය, මුහුදු දිය ආශ්‍රිතව වැඩි වශයෙන් ආහාර සොයා ගැනීම, සමහර සතුන් ආලෝකයක් විහිදුවා විදුලිය නිපදවීම, මුහුදු සතුන් ගෙන් නැව්වලට හානි සිදුවීම, වැනි දහස් ගණනක් කරුණු පිළිබඳ හැදෑරෙයි.

නෞකා ඉංජිනේරු විද්‍යාව අපේ අධ්‍යාප- නය හා ආර්ථික ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගත යුතු ය. නැව් සහ දිය යට උප- කරණ සාදන වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතු ය. මුහුදු පත්ල දක්වා ම සෝදිසි කිරීම් හා පරීක්ෂණයන් හා ගවේෂණයන් ආරම්භ කළ යුතු ය. මුහුදු ජලයේ තත්ත්වය, උෂ්ණත්වය හා ලව- ණතාව නිවැරදිව සොයා ගැනීමත් මුහුදු ජලයේ ලවණ ගතිය ඉවත් කොට පිරිසිදු ජලය ලෙසින් බීමට ගත හැකි ආකාරය ගැන පරීක්ෂණ කිරීමත් කළ හැකි ය.

ලොව බොහෝ රටවල් සාගරය පිළිබඳ තොරතුරු හා අධ්‍යනය සඳහා දැනට- මත් නැව් 250ක් පමණ යොදවා තිබේ. රජය පමණක් නොව පෞද්ගලික අංශය ද මේ කාර්යයට අත ගසා ඇත. වටේට ම මුහුද ඇති අපේ රටට මෙවැනි කාර්යයක නිරතවීමට නොහැකි ද?

මෙහිදී ගැඹුරු මුහුදේ අඩි 36,000 වඩා යට සාගර පත්ලේ කිමිද පරීක්ෂණ පැවැත්වෙයි.

අද සමහර මුහුදු සතුන්ගේ ලොම්වලින් ලෝම ඇඳුම් සාදා තිබේ. එක්දාස් අටසිය ගණන්වල මෙවැනි මුහුදු සතුන් වැඩියෙන් දඩයම් කිරීම නිසා ඔවුන් ගේ පැතිරීම අඩු වී ඇත.

මුහුදේ විශාල අයිස් කුට්ටි පාවෙන බව සොයාගෙන ඇත. මේ සොයාගැනීම්- වලින් පසු අයිස් කුට්ටි හඳුනාගැනීමේ පර්යේෂණ ද සාර්ථකව සිදුකර ඇත.

විකිරණශීලී ද්‍රව්‍ය විශාල වශයෙන් මුහුදට විසි කිරීම තුළින් ලෝකයට සිදුවන හානි පර්යේෂණයට ලක්වී ඇත.

සකල ලෝකයාට වස්තු නිධානයක් ලෙසට, මුහුද, පර්යේෂණවල දී පෙනී ගොස් ඇත. මෙයට වසර තුන් දහසකට පමන පෙර සිට මිනිසා කිමිදුම් උපක- රණ පාවිච්චි කර තිබේ. ඒ තරම් කාල- යක සිට දියුණු වෙමින් ආ මුහුද ජය ගැන්ම සඳහා ශ්‍රී ලංකාව අවධානය යොමු නොකිරීම අපරාධයකි. දිය යට දී හුස්ම ගැනීමේ ක්‍රමයක් සහිතව අංග සම්පූර්ණ කිමිදුම් කට්ටලයක් සොයා ගැනීමේ ගෞරවය හිමි වී ඇත්තේ 1490 දී පමණ ප්‍රකට චිත්‍ර ශිල්පියෙකු ද වූ ඉතාලි ජාතික ලියනාඩෝ ඩාවින්චිට ය.

ඕලන්දයේ කෝර්නේලිසස් වැන් ඩ්‍රිබල් 1620 දී ඉංග්‍රීසි නාවුක හමුදාව සඳහා දිය යටින් යන ලී නැවක් නිර්මාණය කළේ ය. ඇතුළට වතුර යාම වැළැක්වී- මට යොදා ඇත්තේ තෙල් ගාන ලද සම්වලින් නැවේ පිට පැත්ත වැසීම ය. එංගලන්තයේ ජේම්ස් රජු මේ නැවෙන් අඩි 15ක් දිය යටින් සවාරියක් ගියේයැයි සඳහන් වෙයි.

අමෙරිකානු යුද සමයේ දී බ්‍රිතාන්‍යයන් ලීයෙන් බෝට්ටු සාදා ක්‍රියා කරවා ඇත. නැව් විනාශ කිරීමේ ශක්තිය ඇති සබ්- මැරීන් ද පසුකාලීනව නිපැදවිණි.

එක තැන පැය ගණනක් වතුර යට සිටීමේ හැකියාව ඇති යාත්‍රා ද, දිය යට පැය ගණන් පර්යේෂණවල යෙදීමේ යාත්‍රා ද නිර්මාණය වී ඇත. සබ්මැරීන් යොදා දිය යට පර්යේෂණ ද ඇරැඹිණි.

ඇඳුම් කට්ටලයක් නැතිව මුහුදු ආවර- ණයකින් පමණක් කිමිදීමේ හැකියාව විද්‍යාඥයෝ සොයාගත්හ. සිප්පි කටු හා ලීවලින් කිමිදුම් කණ්නාඩි නිර්මාණය කළහ. අයිස් තරම් සීතල වතුරේ අප- හසුවකින් තොරව සිටීමට හැකි රබර් ඇඳුම් සැකසූහ. දිය යට මුහුදු ප්‍රාණීන් නිරීක්ෂණය, ඒ මඟින් වඩාත් වේගවත් විය. පුදුම උපදවන සූර්ය ශාක හා ජීවීන් මුහුද යටින් සොයා ගන්නට මින් හැකි විය.

එළිය විහිදුවන පොතු සහිත මාළු දිය යට දී දැක ගත්හ. මෙවන් විසිතුරු ලොවක් ඇත්දැයි සිතෙන තරමට ලස්සන මාළු සහ පුදුම උපදවන සත්ත්වයන් හා ශාක ගැඹුරු මුහුදේ දක්නට ලැබිණි. පර්යේෂණ සඳහා ගිය සමහරු තමන්ට ආපසු එන්නට නොසිතිනැයි ද ප්‍රකාශ කර ඇත.

සාගරයේ විවිධ මට්ටම්වල නිම් නැති සංඛ්‍යාවක් ශාක හා සතුන් ඇතැයි 1846 දී ජර්මන් විද්‍යාඥ ජොහැන්නස් බුලර් පවසා ඇත. අනතුරුව කළ තවත් පර්යේෂණ ගණනාවකින් හෙළි වී ඇත්තේ මෑත අනාගතයේ දී ගැඹුරු මුහුද මිනිසුන් සඳහා අලුත් ආහාර නිධානයක්වනු ඇති බව ය.

සමුද්‍ර ජීව පර්යේෂණාගාර නමින් නිෂ්පා- දිත යන්ත්‍ර හා මිනිසුන් සහිත උපකරණ දිය යට රඳවා පර්යේෂණ කරන තර-

> **මෙයට වසර තුන් දහසකට පමන පෙර සිට මිනිසා කිමිදුම් උපකරණ පාවිච්චි කර තිබේ. ඒ තරම් කාලයක සිට දියුණු වෙමින් ආ මුහුද ජය ගැන්ම සඳහා ශ්‍රී ලංකාව අවධානය යොමු නොකිරීම අපරාධයකි. දිය යට දී හුස්ම ගැනීමේ ක්‍රමයක් සහිතව අංග සම්පූර්ණ කිමිදුම් කට්ටලයක් සොයා ගැනීමේ ගෞරවය හිමි වී ඇත්තේ 1490 දී පමණ ප්‍රකට චිත්‍ර ශිල්පියෙකු ද වූ ඉතාලි ජාතික ලියනාඩෝ ඩාවින්චිට ය.**

මට විද්‍යාව දියුණු වී ඇත. මිනිසා නොදැන හා නොදැක සිටි ශාක හා සත්ත්ව වර්ග 5000 කට වැඩි ප්‍රමාණ- යක් පර්යේෂණවල දී සොයා ගෙන ඇත.

මුහුද යට විස්තර දැනගැනීමේ කලාව දියුණු වී අද අපට ගොඩබිම සිට ඒවා දැක ගැනීමට හැකි වී ඇත. මුහුදේ දියයට කඳු වැටි පවා සොයා ගෙන තිබේ.

මහා සාගරයේ ජලය ඉවත් කිරීමට හැකි නම් පුළුල් මිටියාවත්, උස් පහත් කඳු වැටි හා ගංගාවලින් සැකසුණු ආශ්චර්- යමත් දර්ශන දැකගත හැකි යැයි මුහුදු පතුල පිළිබඳ පොතක් ලියන සෝවියට් දේශයේ බිලැස් මීර් සහ නාඩා කොවාලික් ප්‍රකාශ කර තිබිණි.

විශාල ඛනිජ සම්භාරයක් මුහුදු පත්ලේ තිබේ. එමෙන්ම ලෝකය වටා සැතපුම් 40000 ක් ඇතුළට විවිධ දිශාවන්ට පැතිරී ගිය කඳු වැටියක් ඇතැයි සොයා ගෙන තිබේ. හවායි සහ ගුවාම් දූපත් අතර මුහුදේ අඩි 14130 ක් උස කන්දක් ඇතැයි හෙළි වී ඇත.

නා නා විධ ගල් කැබලි, ඛනිජ ද්‍රව්‍ය, මාළු දත්, දුර්ලබ දිලිසෙන පාෂාණ මුහුදට යට ඇත. සියලු ගංගා මුහුදට ගලා යන බැවින් ගොඩ බිම සිට ගසා ගෙන ගොස් කාලයක් මුහුදේ තිබී ඒවායින් සැදුණු විවිධ දේ මුහුදේ වෙයි.

ඇඳුම් කට්ටලයක් නැතිව මුහුදු ආවරණයකින් පමණක් කිමිදීමේ හැකියාව විද්‍යාඥයෝ සොයාගත්හ. සිප්පි කටු හා ලීවලින් කිමිදුම් කණ්නාඩි නිර්මාණය කළහ. අයිස් තරම් සීතල වතුරේ අපහසුවකින් තොරව සිටීමට හැකි රබර් ඇඳුම් සැකසූහ. දිය යට මුහුදු ප්‍රාණීන් නිරීක්ෂණය, ඒ මඟින් වඩාත් වේගවත් විය. පුදුම උපදවන සූර්ය ශාක හා ජීවින් මුහුද යටින් සොයා ගන්නට මින් හැකි විය.

මුහුදේ සුන්බුන් අධ්‍යයනයට අවශ්‍ය උපකරණ අද නිපදවා තිබේ.

මහා සාගරයේ, රත්තරං, රිදී යකඩ සහ ටින් ද, තෙල් ද තිබේ.

සෑම විට ම චලනයෙහි නියැලී සිටින මුහුදෙන් බල ශක්තිය නිපදවා ගැනීමට පර්යේෂණ අරඹා ඇත. මුහුදු ජලය ආශ්‍රයෙන් විදුලිය නිෂ්පාදනය කරන්නට පර්යේෂණ කළ හැකි ය.

ටයිටැනික් නමැති නෞකාව මගීන් සහිතව අයිස් කුට්ටියක හැපීමෙන් විනාශ වූයේ 1912 දී ය. පාවෙන අයිස් කුට්ටි ගැන සොයා බලා අයිස් කුට්ටි ඇති පෙදෙස්වල සිතියම් සකස් කිරීම ද වැදගත් කාර්යයකි. විශාල දූපත් වැනි අයිස් කුට්ටි ද වෙයි. ඒවා දැක ගැනීමට ලැබෙන ලෙස පාට ගැන්වීම් ද සිදුකර ඇත. මේ අතර අයිස් කුට්ටිවලට යටින් ගමන් කළ හැකි සබ් මැරීන් ද නිෂ්පාදනය කර ඇත.

ලෝකයේ සෑම පුද්ගලයෙක් ම ධනවතකු කිරීමට තරම් සෑහෙන රන් කැබලි සම්භාරයක් සාගරයේ තැන්පත්ව තිබේ යැයි විද්‍යාඥයෝ පෙන්වා දී ඇත. දියමන්ති ද එසේම ය. අඩු වියදමින් මේ ලබා ගන්නේ කෙසේ ද යන්න ගැටලුවකි.

අප්‍රිකානු වෙරළ අසලින් සැමුවෙල් සී. කොලින්ස් නමැති ඇමරිකානුවෙක් ඩොලර් ලක්ෂ ගණනක දියමන්ති ගොඩ ගෙන ඇත. අප්‍රිකානු රුසියනු ගොඩබිම ආකාරවලින් ලබාගන්නවාට වඩා පස් ගුණයක් මුහුදින් දියමන්ති ලබාගන්නා බව ද නොරහසකි.

මැන්ගනීස් නමැති ලෝහ ද්‍රව්‍ය මුහුදු පොළොවේ වර්ග සැතපුම් එක් කෝටි නව ලක්ෂයක් පුරා ප්‍රදේශයක විසිරී පවතින බැව් ඇමරිකානු ජාතික ආචාර්ය ජෝන් වෙරෝ සොයා ගෙන ඇත.

ගොඩ බිමින් හාරා ගන්නා ඛනිජ ද්‍රව්‍ය අවසන් වූවත් මුහුදු පත්ලේ ඛනිජ ද්‍රව්‍ය තවතවත් ලියලමින් බිහි වීම ආශ්චර්යයක් වෙයි.

මුහුදේ සුලබ ම ද්‍රව්‍යයී නම් ලුණුයි. එහෙත් අපි පිටරටින් ලුණු ගෙන්වා ගන්නා තරමට පහත් තත්ත්වයට පත්ව තිබීම කෙතරම් ඛේදජනක ද? සබන්වල සිට බෙහෙත් ද්‍රව්‍ය දක්වා ඕනෑම දෙයක් සෑදීමට යොදා ගත හැකි විවිධ ද්‍රව්‍ය මුහුද ආශ්‍රිතව ඇත. මුහුදේ සමහරක් මුහුදු ශාකවල, සමහරක් මාළුවන් ගේ ශරීරවල හා මැරුණු මාළුන් ගේ දත්වල ද එවැනි වටිනා දේ ඇත.

මුහුද යට විශාල ප්‍රමාණයක් තෙල් ඇතැයි පරීක්ෂණ සිදු කොට ඇත. පොළොව යට පාෂාණ තට්ටුවල තෙල් සොයා ගැන්මට ද පර්යේෂණ කෙරේ.



මුහුද මූලික කොට ගෙන එළිය, තාපය, විදුලිය පමණක් නොවේ. මිනිසාට අවශ්‍ය සෑම දෙයක්ම මුහුද ආශ්‍රය කොට නිපදවීමේ හැකියාව තිබේ.

1872 දී පමණ ද චිලියේ ලා සල්නාස් නගරයේ කම්හලකට ලුණු ඉවත් කළ මුහුදු වතුර විශාල ප්‍රමාණයක් බීමට සපයා ඇති බව දැක් වේ. අද ද ලොව ඇතැම් රටවල් ලුණු ඉවත් කළ මුහුදු ජලය පානයට ගනී.

ජලයෙන් ඉවත් කරන ලුණු පොහොර සහ වෙනත් නොයෙක් දේ සකසා ගැනීමට යොදා ගත හැකි ය. මුහුදු ජලය උණු කිරීම හා මිදෙන්නට හැරීම ඈත කාලයේ සිට ම ලුණු ඉවත් කිරීමට කළ උපක්‍රමයන්ය.

මුහුදු "පුරා විද්‍යා" වද ඉතා වැදගත්ය. වසර 3000 කට පමණ පෙර ගිලුණු නැවක් මෙන්ම දියුණු නගර ද මුහුදට යට වී ඇති බවට මුහුදු පත්ලේ සොයා ගැනීම් වලින් පැවසේ.

වීදුරු වැනි පොතු සහිත ඉතා කුඩා පැළෑටි මුහුදේ බහුලය.

මුහුද මතු පිට පාවෙන පැළෑටි ද වෙයි. සමහර පැලෑටි පොදි ගැසී එකට පවතී. අරුම පුදුම හැඩ රුව ඇති සතුන් ද වේ.

මේ මුහුදු පැළෑටි වැඩි ප්‍රමාණයක් ආහාරයට ගත හැකිය. අවුරුදු සිය ගණන් ඈත එපිට කාලයේදී ද චීන ජාතිකයෝ මේ පැළෑටි ඖෂධ සෑදීමට යොදා ගෙන ඇත. ජපන් ජාතිකයෝ මුහුදේ ඖෂධ වගා කරති.

අයර්ලන්තය, සාගර අවස්ථාවල දී මුහුදේ පැලෑටිවලින් ආහාර සාදා ගෙන ඇත. මුහුදේ වගාවන් කිරීමේ හැකියාව මෙන්ම ගොඩබිමේ මෙන් කිහිප ගුණයක අස්වැන්නක් ලැබීමේ හැකියාව පවතී යැයි ද හෙළි වී ඇත. අතීතයේ සිට මුහුදු පැළෑටි ආහාරයට ගත හැකි බව දැන සිටියත් මේවායින් ආහාර සාදා ගැනීමේ දියුණුවක් තවමත් ඇති වී නැත.

මුහුදු හතු ජීවියෙකි. ප්‍රාණය ඇත්තෙකි. සමහරු එය ශාකයක් ලෙස සිතුවත් මුහුදු හතු ජීවය ඇති ප්‍රාණියකු ලෙස පර්යේෂණ කර සොයා ගෙන ඇත. මුහුදු හතු වතුරේ ඇති ක්‍ෂුද්‍ර ශාක හා සතුන් උරා බොති.

හිරිගල් හා ගල් මල් යනුවෙන් හැඳින්වෙන කොරල් ද ප්‍රාණීන් වර්ගයකි. මුහුදු පත්ලට ඇලී පවතින කොරල් පෙනුමට මල් වැනිය. එහෙත් ඔවුන්ට කටක් තිබේ. ඔවුන් වැනෙන අත්වලින් ගොදුරු අල්ලා ගනිති. අඩි ගණන් දිග සත්තුද වෙති. තරුවක් වැනි පසැඟිල්ලාද ඉන් එකෙකි. මුහුදු කැකිරි ලෙස හඳුන්වන තවත් සත්ත්වයෙකි. කුරුල්ලන්ගේම වැනි හොටක් ඇති මුහුදු සත්තු ද වෙති. සමහර මුහුදු සත්තු කටින් කිසියම් ද්‍රව වමනය කරති. සිත්තරුන් සඳහා සායම් සෑදීමට මේවා යොදා ගැනේ. බෙල්ලො "මුතු" ලබාදෙති. ඇස් නැතත් ආහාර සොයා යන සත්තු ද මුහුදේ වෙති.

ධීවරයන් දැනට මුහුදින් අල්ලන මාළු ප්‍රමාණය වාර්ෂිකව රාත්තල් 10000000000 කට වැඩිය. මාළු වගා කිරීමද මුහුදේ පුළුල්ව කළ හැකිය. මාළු අල්ලන අලෙවි කරන ක්‍රම දියුණු කළ හැකිය.

සැමන් මාළුවා සහ මුහුදු ආඳා කාලයක් මුහුදේ ද කාලයක් මිරිදියෙහි ද ජීවත් වෙති. ආඳා දශ ලක්ෂයක් පමණ බිත්තර දමතැයි කියැවේ. අඟල් 2-3 වැඩුණු පසු ඔවුන් මිරිදිය සොයා යයි. අවුරුදු 7-15 වූ විට නැවත මුහුද කරා යන බව ද සොයා ගෙන ඇත. සැමන් මාලුවා වැඩි කාලයක් මුහුදේ ගත කරන අතර බිත්තර දැමීමට මිරිදිය ජලාශවලට එතැයි ද හෙළි වේ. මිනිසාට දිය යට ජීවත් වීමට හැකි ද යන්න සොයා බැලීමටත් සමහරුන් පර්යේෂණ කර ඇත. 1963 දී මිනිස්සු 7 දෙනෙක්, "ස්ටාර් විලා" හවුස් නමැති දියයට රැඳුණු නෞකා නිවසක ජීවත් වූහ. 1964 දී කිමිදුම්කරුවෝ 4 දෙනෙක් අඩි 40 ක් දිග නළයක් වැනි නිවසකට වී දිය යට දින 9 ක් ගත කළහ. 1965 දී නිවසක් වැඩ පොළක් වශයෙන් මුහුදු පරීක්ෂණාගාරයක් ඇති කළහ. දින 30 ක් එහි නතර වී සිටියහ.

මහා සමුද්‍රයට වඩ වඩාත් ළඟා වෙමින් සමුද්‍රය ජය ගැනීමට ලෝකය වෙර දරද්දී, රට වටේටම මුහුද ඇති අපි තවත් ඔහේ බලා සිටිමු ද?

ලුණු නිෂ්පාදනය ඉහළ නැංවීම, මුහුදු වෙරළ වටා තොටුපළ පිහිටුවීම, මාළු අස්වැන්න වැඩිකර ගැනීම, මත්ස්‍ය වගාව, නැව් සහ දියේ ගමන් කරන වාහන සෑදීම, මුහුදු උපකරණ සහ කිමිදුම් ද්‍රව්‍ය සෑදීම ශාක සහ මත්ස්‍ය ආහාර නිෂ්පාදනය, ආහාර ටින් කිරීමේ හා වෙනත් කල් තබා ගැනීමේ ක්‍රම විසිතුරු මසුන් ඇති කිරීම සඳහා නිෂ්පාදනය, ලෝකයේ වැඩිම නැව් ප්‍රමාණයක් ගමන් ගන්නා මුහුදු මාර්ගයන්හි ආසන්නයේ පිහිටා ඇති හම්බන්තොට වරායක් ඇති කර නැව් අලුත්වැඩියාව හා තෙල් ලබා දීමට පියවර ගැන්ම, මුහුදු පැළෑටි මඟින් ඖෂධ නිෂ්පාදනය ගැන පියවර ගැනීම, මුහුදට අපවිත්‍ර දෑ දැමීම වළක්වා එහි නිල් පැහැති සුන්දරත්වය ආරක්ෂා කිරීම තුළින් සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම ඛණිජ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ ඇරඹීම, වතුරේ ලුණු රස ඉවත් කිරීමට ක්‍රම සොයා බැලීම, උම්බලකඩ නිෂ්පාදනය, කරවල නිෂ්පාදනය වර්ධනය කිරීම ඇතුළුව අපේ රටට අනාගත පැවැත්මට වඩාත් ඵලිතකරව ප්‍රයෝජනයට ගත හැකි සෑම ඉලක්කයක් ම ජය ගැනීමට පියවර තැබීම මූලිකව කළ යුතු ක්‍රියාදාමයකි.

එසේ නොවුවහොත් එක්කෙනා දෙන්නා ගමන් කළ හැකි වාහන මුහුද යටින් හා උඩින් ධාවනය කැරෙන තුරුත් ජැක් ඉවෙස් කුස්ජෝ නමැති මුහුදු පර්යේෂකයා පවසන ආකාරයට "මිනිසුන් මහ පාරේ ඇවිදින්නාක් මෙන් සාගර පතුල මතු පිට ඇවිද යනතුරුත් අපි ඔහේ බලා සිටිනු ඇත. මේ නිසා විද්‍යා තාක්ෂණ ක්‍රියා මාර්ග ඔස්සේ පර්යේෂණ සිදුකර මුහුදු සම්පත් අපේ රටේ ධන නිධානයක් කර ගනිමින් ජන ජීවිත සැපවත් කිරීම සඳහා යොදා ගැනීමේ ඉලක්ක සකසාලීම අවශ්‍යය.

මුහුදු සම්පත් සොයා ගැනීම් පිළිබඳ ඉතිහාසයේ සුළු සිද්ධීන් කිහිපයක් මෙහි සඳහන් කළේ මුහුද වටකර ගෙන සිටින අපට මුහුදින් ගත හැකි පාඩම් පිළිබඳ සුළු වැටහීමක් හෝ ලබා ගත හැකි බැවිනි.

සැමන් මාළුවා සහ මුහුදු ආඳා කාලයක් මුහුදේ ද කාලයක් මිරිදියෙහි ද ජීවත් වෙති. ආඳා දශ ලක්ෂයක් පමණ බිත්තර දමතැයි කියැවේ. අඟල් 2-3 වැඩුණු පසු ඔවුන් මිරිදිය සොයා යයි. අවුරුදු 7-15 වූ විට නැවත මුහුද කරා යන බව ද සොයා ගෙන ඇත. සැමන් මාලුවා වැඩි කාලයක් මුහුදේ ගත කරන අතර බිත්තර දැමීමට මිරිදිය ජලාශවලට එතැයි ද හෙළි වේ.

**වල්පොල දයා සෝමසිරි**